# ජාතික ව්‍යාපාරය හමුවේ ඇති අභියෝගය

අද බොහෝ දෙනකුගේ කතාබහට ලක්වී ඇත්තේ සංධානය රැකගන්නේ කෙසේ ද යන්න ය. සංධානයට ඡන්දය දුන් බහුතරයේ අදහස වනුයේ සංධාන ආණ්ඩුව රැකගෙන ඒකාබද්ධ යාන්ත්‍රණය පරාජයකිරීම ය. ඒ සඳහා විවිධ අය විවිධ යෝජනා ඉදිරිපත්කරති. ඇතැමුන්ගේ මතය වී ඇත්තේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය වෙනුවට මහින්ද රාජපක්‍ෂ මහතාගේ හෝ වෙනත් අයකුගේ හෝ නායකත්වයෙන් සංධානය නැවත පිහිටුවීම ය. ඒ වැදගත් යෝජනාවකි. එහෙත් ප්‍රශ්නය වනුයේ එපමණකින් ඒකාබද්ධ යාන්ත්‍රණය පරාජය කළහැකි ද යන්න ය.

අපි ඒකාබද්ධ යාන්ත්‍රණය සුනාමි සහන මණ්ඩලය ආදී නම්වලින් නොව ඒකාබද්ධ යාන්ත්‍රණය යන නමින් ම හඳුන්වමු. ඒකාබද්ධ යාන්ත්‍රණය යන්න ද සුදුසු නමක් නොවුණ ද සුනාමි සහන මණ්ඩලය ආදී නම්වලින් කෙරෙන්නේ එහි භයානකකම ජනතාවගෙන් සැඟවීම ය. ඒකාබද්ධ යාන්ත්‍රණය යනු කොටි සංවිධානය වෙනම රාජ්‍යයක් ලබාගැනීම සඳහා බටහිරයන්ගේ ආශිර්වාදයෙන් හා අනුග්‍රහයෙන් කරන සටනේ දී කොටින්ට අවශ්‍ය නෛතික පසුබිම සකස්කිරීම සඳහා පරිපාලනයෙහි දී ඔවුන් ආණ්ඩුව හා සම මට්ටමක ලා සැලකීමට යොදාගන්නා ආයතනයක් පමණක් වෙයි. එය එවැනි ආයතනයක් නොවී හුදෙක් ආධාර බෙදන මණ්ඩලයක් වී නම් කොටි සංවිධානය එයට අත්සන් තැබීමට ඉදිරිපත් නොවනු ඇත. වැදගැම්මකට නැති ආයතනයක් හෝ සුළුවෙන් තක්සේරු කළහැකි ආයතනයක් හෝ පිහිටුවීම සඳහා කොටි සහ බටහිරයන් මෙතරම් වලිකන්නේ ඇයි? සොල්හයිම්ට අමතරව හෙල්ගසන් තකහනියක් ලංකාවට පැමිණෙන්නේත් එසේ පැමිණ කොළඹ හෝටලයක සති ගණන් ජදිංචි වී සිටින්නේත් හුදෙක් අප කෙරෙහි උපන් දයානුකම්පාවෙන් ද?

ජාතිකත්වය ගසා කා බලයට පැමිණීමට වලිකන අතලොස්සක් සහ ජාතික ව්‍යාපාරයෙහි සිටින බටහිර ඒජන්තයන් මේ අවස්ථාවේ සියල්ල අවුල්කර සිංහලයන් විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් දුර්වලකිරීම සඳහා කටයුතුකරන බව ද රහසක් නො වෙයි. ඇතැම්හු ජාතික හෙළ උරුමය හා ජනතා විමුක්ති පෙරමුණ එකතුකිරීමේ උත්සාහයක යෙදෙති. විශේෂයෙන් ම පිටරට සිටින ඇතැම් සිංහලයන් ඒ සඳහා කටයුතු කරනු දැකිය හැකි ය. එහෙත් අවාසනාවකට එවැනි ප්‍රෝඩාකාරී නියෝජිතයන් සමග කෙරෙන එකතුවක් කෙළවර වනු ඇත්තේ අනවශ්‍ය බොරු තර්ජන, ගර්ජන, වර්ජන ඇතිකර ජාතික ව්‍යාපාරය සුන්නත්දූලිකිරීම සඳහා ආණ්ඩුව මෙහෙයවීමට බටහිරයන්ට ඉඩකඩ සැපයීමෙන් ය.

සංධානය වැටීමෙන් වඩාත්ම ප්‍රීතියට පත්වී ඇත්තේ විජාතික බලවේග ය. සංධානය සමස්තයක් ලෙස ගත්කල ජාතිකත්වයේ බලවේගය නොවුවත් එය එක්සත් ජාතික පක්‍ෂයට වඩා වෙනස් වූ බව අමතක නොකළ යුතු ය. අද ඇති ප්‍රශ්නයට ආසන්න ම හේතුව රනිල් වික්‍රමසිංහ මහතා සහ ප්‍රභාකරන් අතර වූ ඊනියා සටන් විරාම ගිවිසුම ය. ඒ ගිවිසුම අත්සන්කරන තුරු ඒ ජා ප ඇමතිවරුන් ද ඒ නොදැන සිටි බව ලොකුබණ්ඩාර මහතා පාර්ලිමේන්තුවේ කරන ලද ප්‍රකාශයකින් හෙළිදරවු විය. හොර රහසේම නෝර්වේ නියෝජිතයන් විසින් සකස්කරන ලද ගිවිසුම රනිල් වික්‍රමසිංහ මහතාගේත් ප්‍රභාකරන්ගේත් අත්සනින් නිකුත් විය. ඒ ගිවිසුම ඔස්සේ කොටි සංවිධානයට ආණ්ඩුව සමග මෙන් ම හමුදාව සමග ද සම මට්ටමක් ලැබුණි. ඒකාබද්ධ යාන්ත්‍රණයෙන් කොටින්ට ආණ්ඩුව සමග පරිපාලනයේ දී සම මට්ටමක් ලැබෙයි. ඒ සඳහා අවශ්‍ය ලියවිලි ද හොර රහසේම සකස් කෙරිණි. ඒ කෙටුම්පත්කළ අය කවුරුන්දැයි හරිහැටි දැනගැනීමට නොහැකි වුව ද එහි අඩංගු කරුණු කවරේදැයි හෙල්ගසන් සොල්හයිම් කණ්ඩායම දැන සිටි බව පැහැදිලි ය. (කෙටුම්පත්කළ එක් අයකු ලෙස රාම්මානික්කලිංගම් නමැත්තාගේ නම ද කියැවෙයි.) ඒ ලියවිලි ආණ්ඩුව හා කොටි සංවිධානය අතර හුවමාරු වීමෙන් පසු නෝර්වේ නියෝජිතයන්ගේ අනුදැනුම ද ඇතිව දෙපාර්ශ්වය අතර යම් එකඟත්වයක් ඇති වී තිබෙන බව ද පැහැදිලි ය.

පසුගියදා හෙල්ගසන් කීවේ ලියැවිල්ලෙහි තවත් වෙනස්කම් නොකළ හැකි බව ය. රාවුෆ් හකීම් මහතා මුස්ලිම් නියෝජනත්වයක් පිළිබඳ හෙල්ගසන් හමුවිය. මේ හමුවීම්වලින් ම පැහැදිලිවන්නේ රටේ ස්වෛරීභාවයට ඇති වී තිබෙන තර්ජනය ය. අද මෙරට පිළිගත් දේශපාලන පක්‍ෂවලට රටේ අභ්‍යන්තර ප්‍රශ්න පිළිබඳ ව හෙල්ගසන් සමග සාකච්ඡාකිරීමට සිදු වී ඇත. කෙසේ හෝ ඒ හමුවීමේ දී හෙල්ගසන් කියා ඇත්තේ දැන් ලියැවිල්ල අවසන්කර ඇති බව ය. එහි තේරුම මුස්ලිම් නියෝජනත්වයකට කොටි එකඟ නොවන බව ය. කොටි භාණ්ඩාගාරය ඔස්සේ ප්‍රතිපාදන

© Prof. Nalin De Silva

බෙදීමට ද විරුද්ධ වෙති. ඔවුන්ට අවශ්‍ය ලෝක බැංකු මැදිහත්වීමකි. එමෙන් ම ඒකාබද්ධ යාන්ත්‍රණයට පාර්ලිමේන්තුවට යටත්කිරීමට ද ඔවුහු විරුද්ධ වෙති. ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණ ලියවිල්ලට කොට් අත්සන්කිරීමට බලාපොරොත්තුවන්නේ දේශපාලන පක්ෂයක් හෝ සංවිධානයක් ලෙස හෝ නොව විකල්ප පරිපාලනයක් ලෙසින් ය. ඒ සියල්ල ආණ්ඩුවට යටත් නැති විකල්ප ආණ්ඩුවක් ලෙස කටයුතුකිරීමට ය.  ඔවුන් වෙනත් දේශපාලන පක්ෂයක් ඒ ලියැවිල්ලෙහි තුන්වැනි පාර්ශවකරුවකු වීමට විරුද්ධ වනු ඇත.  මෙහි තවත් පැත්තක් ද වෙයි. මේ ලියවිල්ලෙහි සිංහලයන් වෙනුවෙන් අත්සන්කිරීමක් ගැන පවා කිසිවෙක් කතා නො කරති. ඒකාබද්ධ යාන්ත්‍රණය ප්‍රතික්ෂෙප කරන සංවිධාන සිංහලයන් වෙනුවෙන් අත්සන්කිරීමක් ගැන කතා නොකිරීම ප්‍රශ්නයක් නො වෙයි. ඒ ඔවුන් සමස්ත ලියවිල්ලම ප්‍රතික්ෂෙපකරන බැවින් ය. එහෙත් ඒකාබද්ධ යාන්ත්‍රණය වෙනුවෙන් කතාකරන කිසිවකුට උතුරු හා නැගෙනහිර පළාත්වල සිංහලයන් අමතක වන්නේ කෙසේ ද? ඔවුන් සිතන්නේ ආණ්ඩුව සිංහලයන් වෙනුවෙන් පෙනී සිටින බව ද? මේ ආණ්ඩුව සිංහලයන්ගේ ආණ්ඩුවක් යැයි කීම තරම් සිංහලයන්ට කළහැකි තව අගෞරවයක් නැත.

ඒකාබද්ධ යාන්ත්‍රණ ලියවිල්ල පිළිබඳ ව ආණ්ඩුව කටයුතුකළ ආකාරය පිළිබඳ ව බටහිරයන් සෑහීමකට පත්වී ඇතැයි සිතිය නො හැකි ය. බටහිරයන්ට අවශ්‍යවන්නට ඇත්තේ රනිල් වික්‍රමසිංහ මහතා කළාක් මෙන් කිසිවකුටවත් නොදන්වා කුමාරතුංග මහත්මිය හා ප්‍රභාකරන් ලියැවිල්ලට අත්සන්කිරීම ය. කෙසේ හෝ ලියැවිල්ල පිළිබඳ ව රටේ සාකච්ඡාවක් සිදුවිය. මේ ලියැවිල්ල අත්සන්කළා හෝ නොකළා හෝ බටහිරයන්ට තවදුරටත් සංධාන ආණ්ඩුව අවශ්‍ය නො වීය. එයට ප්‍රධාන හේතුව වූයේ සමස්තයක් ලෙස නොවුණ ද යම් ප්‍රමාණයකට ආණ්ඩුවෙන් ජාතිකත්වය නියෝජනය වීම ය. විශේෂයෙන් ම ජ වි පෙ ආණ්ඩුවේ සිටීම බටහිරයන්ට හිසරදයක් විය. ආණ්ඩුව වැට්ටවීම සඳහා සංධානය බිඳවීම බටහිරයන්ගේ අවශ්‍යතාව විය. සංධාන ආණ්ඩුව රැකීමට ප්‍රධාන බාධකය බටහිර රාජ්‍යවිය. ආණ්ඩුවේ ඇතැම් නායක නායිකාවෝ ද එයට බාධකබවට පත්වූහ. ජ වි පෙ සංධානයෙන් ඉවත්කිරීම බටහිරයන්ගේ පළමු ඉලක්කය විය. ජ වි පෙ සංධානයෙන් ඉවත් වූ පසු ලියැවිල්ල අත්සන් කළහොත් බටහිරයන්ට සතුටු විය හැකි විය. අනෙක් අතට ලියැවිල්ල අත්සන් නොකළද ආණ්ඩුව වැඩිකල් නොපවතිනු ඇතැයි යන්න බටහිරයන්ගේ තක්සේරුව විය. පාර්ලිමේන්තුවේ වැඩිඡන්දයක් නොමැතිව ආණ්ඩුවක් පවත්වාගෙන යා නොහැකි යැයි ඔවුහු විශ්වාසකරති. විශේෂයෙන්ම ජනාධිපතිවරණයක් ළඟදීම පවත්වා රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති බවට පත්කරගැනීම ඔවුන්ගේ අවශ්‍යතාව වෙයි. ඉන්පසු හොර රහසේම අවශ්‍ය සියළු ගිවිසුම් අත්සන්කිරීමට හැකිවෙයි.

ජ වි පෙරමුණට ආණ්ඩුවෙන් ඉවත්වීම සඳහා අවශ්‍ය සාධක නිර්මානය කෙරිනි. ජාතික හෙළ උරුමය හා ජ වි පෙ අතර ජාතික බලවේග දිනාගැනීම සඳහා තිබූ අරගලය ද ඒ සඳහා යොදා ගැණිනි. එමෙන් ම ලංකාවේ මෙන් ම ජපානය වැනි රටවල ද සිටින ජ වි පෙට ආධාරකරන අය ද ඒ සඳහා යොදාගත්තේ යැයි විශ්වාස කළ හැකි ය. කෙසේ හෝ අවසානයේ දී බටහිරයන්ගේ, දෙමළ ජාතිවාදීන්ගේ හා ඔවුන්ගේ ගැත්තන්ගේ හා බැලයන්ගේ අවශ්‍යතාව ඉටුවිය. දැන් බටහිරයන්ට අවශ්‍ය සිංහල ජාතික බලවේග හැකිනම් සම්පූර්ණයෙන් විනාශකිරීම ය. ඒ කුමන්ත්‍රණයක් නො වෙයි. කසිකබල් පශ්චාත් මාක්ස්වාදීන් කියන්නේ අපට අනුව බටහිරයන් සිංහලයන් නැතිකිරීමට කුමන්ත්‍රණකරන බව ය. කුමන්ත්‍රණ කතා හෙවත් ප්‍රවාද මෙරටෙහි ප්‍රචලිත කළෝ මාක්ස්වාදීහුම ය. ලෝක බැංකු කුමන්ත්‍රණ අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ ගැන කතාකෙළේ පශ්චාත්මාක්ස්වාදීන්ගේ මුත්තන් වූ පැරණි කසිකබල් මාක්ස්වාදීන් මිස අප නො වේ. ප්‍රවාදයක් ගොතාගැනීමට තරම් නිර්මානශීලීත්වයක් නොතිබූ මේ පුස්සන්ට කුමන්ත්‍රණ කතා බෙහෙවින් ප්‍රයෝජනවත් විය. සිංහල සංස්කෘතිය වැනසීමට බටහිරයන්ගේ කුමන්ත්‍රණයක් නැත. ක්‍රිස්තියානි නොවන සියළු සංස්කෘතීන් නැතිකිරීම බටහිරයන්ගේ ක්‍රිස්තියානි නූතනත්වයේ අංගයක් වෙයි. ලංකාවේ දී ඒ සඳහා යොදවාගැනෙන්නන් අතර දෙමළ ජාතිවාදීන් මෙන් ම පැරණි හා පශ්චාත් මාක්ස්වාදීහු ද වෙති.

අද ජාතික ව්‍යාපාරය තම උපාය සකස්කළ යුත්තේ මේ කරුණු සියල්ල සහ තවත් දෑ සැලකිල්ලට ගැනීමෙන් මිස ආවේගශීලීව නො වෙයි. සංධානය රැකීම යනු එය සංවිධානයක් ලෙස රැකගැනීම නොව බටහිරයන්ගේ සෘජු නියෝජිතයා වූ එ ජා ප බලයට පත්වීම වැළැක්වීම ය. විජාතික බලවේග ශක්තිමත්කිරීමෙන් වැළකීම ය. ඒ අතර සංධානගත ව සිටි විජාතික බලවේගවල සියළු නියෝජිතයන් හා විජාතික බලවේග වෙනුවෙන් සේවයකළ නායක නායිකාවන් ඉන් එළවා දමා ජාතිකත්වයේ සංධානය බිහිකිරීම ය.

© Prof. Nalin De Silva